සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 07 | |
| විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංගකලාව | |
| පත්‍රය / வினாத்தாள் / Paper | I,II | |
| කාලය / காலம் / Time | පැය 1 1/2 | |

නම :- ....................................................................................... විභාග අංකය :- ..........................

සැලකිය යුතුයි:
- I හා II යන කොටස්වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත ය.
- I කොටසේ සියළු ම ප්‍රශ්නවලට හා II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.
- I හා II ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

## I කොටස

❖ අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) ළමා නාට්‍යයක් යනු,
(1) ළමයින් විසින් රඟපාන නාට්‍යයි.
(2) වැඩිහිටියන් විසින් ළමයින් මෙන් රඟපාන නාට්‍යයයි.
(3) ළමා සිතුම්පැතුම්වලට සරිලන ලෙස ළමා ලෝකය නියෝජනය කරමින් නිර්මාණය වූ නාට්‍යයි.
(4) පාසල්වල පාසල් ළමුන් සඳහා නිෂ්පාදනය වන නාට්‍යයි.

(02) ළමා නාට්‍යයකි.
(1) එළොව ගිහින් මෙළොව ආවා. (2) නරිබෑණා
(3) නෙළුම් පොකුණ (4) කදා වළලු

(03) ස්වර අභ්‍යාස සඳහා කියවීමට සුදුසු ග්‍රන්ථයකි.
(1) නම් පොත (2) පෙළපොත (3) මළපොත (4) බණ පොත

(04) මේ වැල මොකදෝ දම්වැල
මේ වැල මොකදෝ කිරිවැල
මේ කවිපද ඇතුළත් ජන ක්‍රීඩාව කුමක් ද?
(1) එළුවන් කෑම (2) කළගෙඩි සෙල්ලම
(3) මේවර කෙළිය (4) ඔළිඳ කෙළිය

(05) නාට්‍ය පෙළක් රංගගත කිරීම සඳහා
(1) සාමාන්‍ය ජීවිතයේ භාවිතා කරනු ලබන වස්ත්‍ර හා ආභරණ තෝරා ගැනීම සුදුසු ය.
(2) සියළු චරිත සඳහා පොදු වර්ණයක් හා පොදු ඇඳුමක් තෝරා ගැනීම සුදුසු ය.
(3) ඒ ඒ චරිතයට ගැළපෙන අයුරින් රංග වස්ත්‍ර සකස් විය යුතු ය.
(4) අඩු වියදමකින් සකස් කරගත් රංග වස්ත්‍රාභරණ විය යුතු ය.

(06) කලාත්මක වෙස් මුහුණක් නිර්මාණය කර ගැනීම සඳහා සුදුසු ලී වර්ගයකි.
(1) පොල් ලී (2) කදුරු ලී (3) කොස් ලී (4) පුවක් ලී

(07) පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරන නිරූපණය

(1) අභිරූපණයයි. (2) අනුකරණයයි.

(3) රූපණයයි. (4) ක්ෂණික නිරූපණයයි.

❖ **අංක 08 - 10 දක්වා ප්‍රශ්නවල නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

(08) වෙස් මුහුණක් පැළඳ රංගනය කිරීමේ දී

(1) රූපණයට මනා පිටුබලයක් ලැබේ.

(2) සබකෝලයෙන් යුතු සිසුන්ට වුව ද රංගනයට පහසුවක් ගෙන දෙයි.

(3) රංගනයේ දී විවිධ භාවයන් ප්‍රකාශ කිරීමට පහසුවක් ලැබේ.

(4) ස්ථාවර භාවයක් වෙස් මුහුණින් නිරූපණය වේ.

(09) නාට්‍ය පෙළක ඇතුළත් ලක්ෂණයකි.

(1) සංවාද (2) චරිත (3) රංග විධාන (4) රූපණය

(10) (1) හැඟීම් ප්‍රකාශනය සඳහා ඉතාම වැදගත් වන්නේ කට හඬයි.

(2) කෙනෙකුගේ කටහඬ ඕනෑම චරිතයකට ගැළපේ.

(3) කටහඬ උස් පහත් කිරීම හා වෙනස් කිරීම මගින් විවිධ හැඟීම් ප්‍රකාශ කළ හැකි ය.

(4) හැඟීම් ප්‍රකාශනයට අනුව කටහඬ වෙනස් වේ.

❖ **අංක 11 - 15 දක්වා ප්‍රකාශ හරි නම් ✓ ලකුණ ද, වැරදි නම් × ලකුණ ද යොදන්න.**

(11) ටෙලි නාට්‍ය ප්‍රදර්ශනයේ දී ප්‍රේක්ෂකයාගේ සෘජු ප්‍රතිචාර ලැබේ. ( )

(12) ගුවන් විදුලිය සැලකෙන්නේ ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස ය. ( )

(13) රංග අභ්‍යාස සබකෝලය දුරුලීමට ඉවහල් වේ. ( )

(14) සාමාන්‍ය ජීවිතයේ සිදුවීම් හා අත්දැකීම් අතර නාට්‍යෝචිත අවස්ථා තිබේ. ( )

(15) සංගීතය නාට්‍යමය අවස්ථා තීව්‍ර කිරීමට උදව් වේ. ( )

❖ **අංක 16 - 20 දක්වා වගන්තිවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(රංගාභරණ, වෙස් මෝස්තර, වෙස්මුහුණ, ආනුෂංගික, තේමාව)

(16) ගැමි නාටක, බලි තොවිල් ශාන්ති කර්ම ආදියෙහි ...................................... භාවිතා කරන ලදි.

(17) රංගනයේ දී නළු නිළියන් පළඳිනු ලබන ආභරණ ............................................. නමින් හැඳින්වේ.

(18) නාට්‍යයක කතා වස්තුවෙන් ප්‍රකාශ කරන අදහස ................................................ වේ.

(19) නාට්‍යයක දී නළු නිළියන් විවිධ චරිත සඳහා අඳින ඇඳුම් ...................................... නමින් හැඳින්වේ.

(20) වේදිකා නාට්‍යයක් සඳහා භාවිතා වන විවිධ කලා ප්‍රභේද ............................................ කලා ලෙස හඳුන්වයි.

(ලකුණු 1 x 20 = 20

## II කොටස

* පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.

(01) (i) "අමර ගියා දිව්‍ය ලෝකෙ" නාට්‍ය පෙළ රචනා කරන ලද්දේ කවු ද? (ලකුණු 01)

(ii) මෙම නාට්‍යය සැලකෙන්නේ කවර වර්ගයේ නාට්‍යයක් ලෙස ද? (ලකුණු 02)

(iii) මෙම නාට්‍යයේ එන චරිත හතරක් නම් කරන්න. (ලකුණු 02)

(iv) අමරගේ චරිත ලක්ෂණයක් සඳහන් කරන්න. (ලකුණු 02)

(v) මෙම නාට්‍යයේ තේමාව කුමක් ද? (ලකුණු 02)

(vi) මෙම නාට්‍ය රචකයාගේ වෙනත් ළමා නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 01)

(02) (i) රංග භූමියක් යනු කුමක් ද? (ලකුණු 03)

(ii) අතීත ලංකාවේ භාවිත වුණු රංග භූමි තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ඔබ නම් කරන ලද රංගභූමිවල රූප සටහන් ඇඳ දක්වන්න. (ලකුණු 04)

(03) (i) ශිථිලකරණ අභ්‍යාස යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ශිථිලකරණ අභ්‍යාසවලින් ඇතිවන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 04)

(iii) ශිථිලකරණ අභ්‍යාසයක් සිදු කරන ආකාරය ලියන්න. (ලකුණු 04)

(04)

වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

(i) මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද? (ලකුණු 02)

(ii) මේ කවියේ අදහස්වලින් උපදේශාත්මක වැකියක් ලියන්න. (ලකුණු 04)

(iii) ඔබ ලියන ලද උපදේශාත්මක වැකිය තේමා කරගෙන කුඩා කතාවක් හෝ කුඩා නාට්‍යයක් නිර්මාණය කරන්න. (ලකුණු 04)

(05) (i) ඓතිහාසික කතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) ඓතිහාසික කතා කියවීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 04)

(iii) ඓතිහාසික කතා ඇසුරෙන් නිර්මාණය වී තිබෙන චිත්‍රපට දෙකක් හා වේදිකා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: ප්‍රායෝගික පරීක්ෂණය |

(01) නාට්‍ය ගීතකයක් හෝ සරල ගීයක් තෝරාගෙන සරල චලන සමඟ ගායනා කිරීම (කේවල) (ලකුණු 10)

(02) නිර්දිෂ්ට නාට්‍ය පෙළෙන් කැමැති දෙබසක් තෝරාගෙන ඉදිරිපත් කිරීම (කේවල) (ලකුණු 10)

(03) ජන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කිරීම (කේවල) (ලකුණු 10)

(04) අභිරූපණ රංගනයක් ඉදිරිපත් කරන්න. (කේවල) (ලකුණු 10)

(05) දෙන ලද මාතෘකාවකට අනුව ක්ෂණික නිරූපණයක් ඉදිරිපත් කිරීම (සාමූහික) (ලකුණු 10)

(මුළු ලකුණු 50)

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| ප්‍රායෝගික පරීක්ෂණය සඳහා | ලකුණු 50 |
| මුළු ලකුණු | 100 |